**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2024.12.20 පැය 1135 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/ 1869 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. විදෙස් රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - වැලිමඩ පොලිස් ස්ථානය.**

2024.12.20 වන අද දින වැලිමඩ පොලිස් වසමේ වැලිමඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මාර්ග බාධක රාජකාරි යෙදී සිටියදී ලද තොරතුරක් මත සැක කටයුතු කාර් රථයක් පරීක්ෂා කිරීමේදී **විදෙස් රටක නිෂ්පාදිත ගිනි අවියක් හා ජීව පතොරම් 02 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 37 හා 53 ක් වයස්වල පසුවන බදුල්ල හා නමුණුකුල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වැලිමඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාකරේ පොලිස් ස්ථානය.**

2024.12.19 වන දින වාකරේ පොලිස් වසමේ වෙරුගල් කදිරවේලි ප්‍රදේශයේදී වාකරේ විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වන කදිරවේලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාකරේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - අඹන්පොල පොලිස් වසම.**

2024.12.19 වන දින රාත්‍රී කාලයේ අඹන්පොල පොලිස් වසමේ නිකවැරටිය අඹන්පොල මාර්ගයේ පනාදරගම සියඹලාගස් හන්දිය ආසන්නයේදී මාර්ගය අයිනේ වාඩි වී සිටි පුද්ගලයකු ලොරි රථයක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා අඹන්පොල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වූ පනාදරගම අඹන්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අඹන්පොල රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අඹන්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. දුම්රියේ ගැටී පුද්ගලයකු මියයාම - දිඹුලපතන පොලිස් වසම.

2024.12.19 වන දින උදෑසන කාලයේ දිඹුලපතන පොලිස් වසමේ නානුඔය සිට මහනුවර දක්වා ගමන් කළ දුම්රිය කොටගල ගංගෙපුරම් දුම්රිය මාර්ගය ආසන්නයේදී පුද්ගලයකුගේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇති අතර අනතුරට ලක් වූ පුද්ගලයා එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකරු කොටගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දික්ඔය රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර දිඹුලපතන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**